(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 2(8).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2020 දෙසැම්බර් 23 බදාදා**

---

**2021 පෙබරවාරි 23 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

32/2020

ගරු හේෂා විතානගේ මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2016 සිට 2020 වර්ෂයේ මේ වන තෙක්,

(i) ශ්‍රී ලංකාවේ පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල් සහ ගුවන්යානා ඉන්ධන ලීටරයක විකුණුම් මිලෙහි උච්චාවචනයන් සිදු වූ ආකාරය කවරේද;

(ii) ඉහත සඳහන් එක් එක් වර්ගයේ ඉන්ධන ලීටරයක් මත පනවන ලද සියලුම බදු වර්ග කවරේද;

(iii) මෙම ඉන්ධන වර්ගයන්හි එක් ලීටරයක් නිෂ්පාදනය කිරීම සඳහා වැයවූ වියදම කවරේද;

(iv) ලෝක වෙළෙඳපොළ මිල ගණන් සමඟ සැසඳීමේ දී, ඉහත සඳහන් එක් එක් ඉන්ධන වර්ගයෙන් ලීටරයක් සඳහා රජය ලැබූ ලාභය/පාඩුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ ඩීසල් සහ පෙට්‍රල් විකුණුම් මිල වෙනස් වීමේ ක්‍රමවේදය කවරේද;

(ii) එමඟින් රජය ලබන ලාභය/පාඩුව කොපමණද;

(iii) එමඟින් පාරිභෝගිකයන්ට ලැබෙන වාසි/අවාසි කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්,ඒ මන්ද?

141/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ වන තෙක් ඌව පළාත් සභාව සම්බන්ධයෙන් සිදු කර ඇති විගණන විමසුම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම විගණන විමසුම් මඟින් පෙන්වා දී ඇති මූල්‍ය අක්‍රමිකතා හා මූල්‍ය අවභාවිතා කිරීම් සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ සම්බන්ධයෙන් ලබා දී ඇති විගණන නිර්දේශ කවරේද;

(iv) එම විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ගනු ලබන පියවර කවරේද;

(v) මූල්‍ය අක්‍රමිකතා හා මූල්‍ය අවභාවිතා කිරීම් සම්බන්ධ දේශපාලන අධිකාරිත්වයට හා නිලධාරින්ට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

173/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ගල්කිස්ස මුහුදු තීරයේ වෙරළ ඛාදනය නතර කිරීම සඳහා රුපියල් මිලියන 890ක වියදමින් ක්‍රියාත්මක කරන ලද වැලි පෝෂණ ව්‍යාපෘතිය අසාර්ථක වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) රජයේ අනුමතිය ඇතිව ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය සඳහා යොදා ගනු ලැබූ ක්‍රමවේදයේ ගැටලු හේතුවෙන් රජයට සිදු වූ පාඩුව සම්බන්ධයෙන් වත්මන් රජය ගනු ලබන පියවර කවරේද;

(ii) එම ව්‍යාපෘතිය අසාර්ථක වීමෙන් ගල්කිස්ස වෙරළ තීරයට හා මුහුදු පරිසර පද්ධතියට යම්කිසි හානියක් සිදු වී ඇත්නම්, එය යථා තත්ත්වයට පත් කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

235/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂය තුළ —

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ පදම් කළ සම් සහ සායම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම පදම් කළ සම් සහ සායම් ආනයනය කළ රටවල් කවරේද;

(iv) එම පදම් කළ සම් සහ සායම් ආනයනය කළ සමාගම්වල නම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට පදම් කළ සම් සහ සායම් ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

265/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් රත්මලානේ පිහිටි ප්‍රධාන නඩත්තු වැඩපළෙහි ධාරිතාවය ප්‍රමාණවත් නොවන බවත්;

(ii) මෙම හේතුව කාර්යක්ෂම දුම්රිය සේවයක් ස්ථාපිත කිරීමට බාධාවක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) රත්මලාන ප්‍රධාන නඩත්තු වැඩපළෙහි ධාරිතාවය වැඩි කිරීමට අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීමට හා යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, මිලදී ගැනීමට අපේක්ෂිත යන්ත්‍ර සූත්‍ර කවරේද;

(iii) එම යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීම සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

(iv) ගොඩනැගිලි ඉදිකිරීම සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

487/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ වැටුප් ප්‍රතිශෝධනයන් කරන ලද අවස්ථා සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැටුප් ප්‍රතිශෝධනයන් මඟින් වැටුප් වැඩි වූ ප්‍රතිශතය කවරේද;

(iii) එම වැටුප් ප්‍රතිශෝධන සිදු වූ සේවා ඛණ්ඩ හා ඊට අදාළ පුද්ගලයන්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සිදු කරනු ලබන වැටුප් වැඩි කිරීම්වලදී ඉහළ නිලධාරීන් සම්බන්ධයෙන් පමණක් සුවිශේෂී අවධානයක් යොමු කර තිබෙන බවට චෝදනා නැඟී ඇති බව එතුමා දන්නෙහිද?

(ඇ) ආයතනයේ සේවයේ නියුතු සෑම සේවකයෙකුටම සමාන ප්‍රතිලාභ ලැබෙන ආකාරයෙන් වැටුප් ප්‍රතිශෝධනයන් සිදු කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

532/2020

ගරු රෝහණ බංඩාර මහතා,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ උග්‍ර පානීය ජල ගැටලු ඇති ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගම්මානවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම ගම්මානවල ජනතාවගේ පානීය ජල ගැටලු විසඳීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

566/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2015 වර්ෂයේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ බැඳුම්කර වංචාවක් සිදු වූ බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඒ හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවට සිදු වී ඇති අලාභය කොපමණද;

(ii) එම අලාභය වළක්වා ගැනීම සඳහා මේ වනවිට පියවර ගෙන තිබේද;

(iii) එම අලාභය පියවා ගැනීමට ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, මන්ද?

567/2020

ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) මිනිස් සමේ පැහැය වෙනස් කරන / පැහැපත් කිරීමේ (සුදු පැහැගැන්වීමේ) ඖෂධ, පෙති, එන්නත් හා ආලේපන විශාල වශයෙන් ශ්‍රී ලංකාව තුළ අලෙවි කරමින් පවතින බව එතුමිය දන්නෙහිද?

(ආ) (i) එසේ අලෙවි කරන ඖෂධ අතරින් ආනයනය කරනු ලබන ඖෂධ සම්බන්ධයෙන් නියාමනය සිදු කරන ආයතනය;

(ii) එම නියාමනයන්ට අදාළ නීතිය;

කවරේද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම ඖෂධ නියම කිරීම සිදු කරන බොහෝ දෙනෙකුට වෛද්‍ය විද්‍යාත්මක දැනුමක් නොමැති බව පිළිගන්නේද;

(ii) එම ඖෂධ භාවිතයෙන් කෙටි කාලීනව විවිධ ආසාත්මිකතා ඇති වන බව වාර්තා වී තිබේද;

(iii) ඖෂධ භාවිතයේ ප්‍රතිඵලයක් ලෙස දිගුකාලීනව භයානක රෝගී තත්ත්වයන් ඇතිවිය හැකි බවට පළ වන වෛද්‍ය මතයන් පිළිබඳව අවධානය යොමු කර තිබේද;

(iv) එසේ නම්, එහිදී අනාවරණය වූ කරුණු කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) එම ඖෂධ භාවිතයෙන් අහිතකර ප්‍රතිඵල ජනිත වේ නම්, එය වැළැක්විය යුතු බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න තවදුරටත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

579/2020

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් උතුරු පළාතේ එක් එක් දිස්ත්‍රික්කයෙන් පවරාගෙන ඇති ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ප්‍රමාණය උතුරු පළාතේ සමස්ත භූමි ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙලෙස ඉඩම් පවරා ගැනීමේදී, පෞද්ගලික ඉඩම්, කෘෂිකාර්මික වැව්, කෘෂිකාර්මික ඉඩම් සහ පශු සම්පත් සඳහා වූ තෘණ භූමි ඉඩම් ද පවරාගෙන ඇති අතර එය ජනතාවගේ ජීවනෝපායට මෙන්ම සහජීවනයටද අහිතකර ලෙස බලපෑම් කර ඇති බව එතුමා දන්නෙහිද?

(ඇ) උක්ත ඉඩම් පවරා ගැනීමේදී දිස්ත්‍රික් ලේකම්වරයාගේ, ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහ පළාත් ඉඩම් කොමසාරිස්වරයාගේ උපදෙස් ලබා නොගැනීමට හේතු කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

614/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කලා වැව සිට තිසා වැව දක්වා ජලය ගෙන යන පරණ යෝධ ඇළ සැල්වීනියා වැනි ජලජ පැළෑටිවලින් වැසී ඇති බවත්;

(ii) මෙම තත්ත්වය ඇළ මාර්ගය ඔස්සේ ජලය ගලා යෑමට බාධාවක් වී ඇති බවත්;

(iii) මේ පිළිබඳව අදාළ නිලධාරීන් කිහිපවරක් දැනුම්වත් කළද, මේ වනතෙක් කිසිදු විසඳුමක් ලැබී නොමැති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉදිරි වගා කටයුතු සඳහා ජලය බෙදා හැරීමට පෙර ඉහත සඳහන් ජලජ පැළෑටි ඉවත් කිරීමට යම් ක්‍රියාමාර්ගයක් ගන්නේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ගය ක්‍රියාත්මක කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

855/2020

ගරු නලින් ප්‍රනාන්දු මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020 අගෝස්තු 31 දිනට සීමාසහිත ලංකා සතොස ආයතනයේ පාරිභෝගික භාණ්ඩ තොගවල දළ වටිනාකම කොපමණද;

(ii) 2020 ජනවාරි 01 දින සිට 2020 අගොස්තු 31 දින දක්වා එක් එක් මාසයේ මාසික ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2020 අගෝස්තු මස 31 දිනට සැපයුම්කරුවන්ට ගෙවීමට තිබූ මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2020 අගොස්තු මස 31 දින වනවිට සීමාසිහිත ලංකා සතොස ආයතනය තුළ තිබූ කල් ඉකුත් වූ භාණ්ඩවල වටිනාකම කොපමණද;

(ii) එම භාණ්ඩ සම්බන්ධයෙන් ආයතනය විසින් ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

857/2020

ගරු ජගත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා හා මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ දිළිඳුකම පිටු දැකීමේ ප්‍රධානම ව්‍යාපාරය සමෘද්ධි ව්‍යාපාරය වන අතර එය දිළිඳුභාවය පිටු දැකීමට විශාල කාර්යභාරයක් ඉටු කර ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ පිහිටා ඇති සමෘද්ධි බැංකු සංඛ්‍යාව කොපමණද;

(ii) එම බැංකුවල තැන්පත් කර ඇති අරමුදල් ප්‍රමාණය කොපමණද;

(iii) එම අරමුදල් ප්‍රමාණය අදාළ ගිණුම් අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පසුගිය රජයේ දේශපාලන ප්‍රතිරූපය ගොඩනගා ගැනීම සඳහා අඩු ආදායම්ලාභීන් විසින් සමෘද්ධි ව්‍යාපාරය තුළ තැන්පත් කර තිබූ විශාල මුදලක් යොදාගෙන ඇති බව දන්නේද?

(ii) එසේ නම්, අවභාවිතා කර ඇති මුදල කොපමණද;

(iii) එම මුදල් යොදා ගනු ලැබූ කාර්යයන් සහ එම මුදල් අයත්වන අරමුදල් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම මුදල් අවභාවිතා කිරීමට සම්බන්ධ වූ පුද්ගලයන් කවරේද;

(v) ඔවුන්ට එරෙහිව නීතිමය පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

866/2020

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නැගෙනහිර පළාතේ අධ්‍යාපන කලාප අතරින් ගුරු අතිරික්තයක් පවතින අධ්‍යාපන කලාපවල නම් කවරේද;

(ii) එම අතිරික්ත ගුරුවරුන් සංඛ්‍යාව එක් එක් විෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) නැගෙනහිර පළාතේ අධ්‍යාපන කලාප අතරින් ගුරු හිඟයක් පවතින අධ්‍යාපන කලාපවල නම් කවරේද;

(iv) එම හිඟ ගුරුවරුන් සංඛ්‍යාව එක් එක් විෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මේ වනවිට නැගෙනහිර පළාත් සභාව ක්‍රියාත්මක නොවන අතර එම පළාත් සභාවේ පරිපාලනය සෘජුවම අදාළ ආණ්ඩුකාරවරයා යටතේ ක්‍රියාත්මක වන බැවින් නැගෙනහිර පළාතේ ගුරු සමතුලිතයක් ඇති කිරීමට අමාත්‍යාංශය විසින් කඩිනම් පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

943/2020

ගරු මයන්ත දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ පවතින රැකියා වියුක්ති අනුපාතය එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම රැකියා වියුක්තිය සඳහා ලබා දෙනු ලබන විසඳුම් කවරේද;

(iii) එම විසඳුම් ලබා දීම තුළින් සපුරා ගැනීමට අපේක්ෂිත ඉලක්කයන් කවරේද;

(iv) එම ඉලක්කයන් සපුරා ගැනීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2021 පෙබරවාරි 24 බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

34/2020

ගරු හේෂා විතානගේ මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු ඉඩම්, විශාල ව්‍යාපෘති සඳහා ලබා දීමේ ක්‍රමවේදය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වලව කලාපයේ, චන්ද්‍රිකා වැව කොට්ඨාසයේ ඩෝල් ලංකා (පෞද්.) සමාගම සහ විටා ඕගනික් (පෞද්.) සමාගම වෙත කෙසෙල් වගා කිරීම සඳහා ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මෙම ඉඩම් නිසි ක්‍රමවේදයක් අනුව ලබා දී නොමැති බව පිළිගන්නේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්,ඒ මන්ද?

142/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— විදුලිබල අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නොරොච්චෝලේ "ලක්විජය" විදුලි බලාගාරය ස්ථාපිත කල දිනය කවරේද;

(ii) එම විදුලි බලාගාරය මඟින් නිෂ්පාදනය කරනු ලබන වාර්ෂික විදුලි ඒකක සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නොරොච්චෝලේ "ලක්විජය" විදුලි බලාගාරය ස්ථාපිත කල දිනයේ සිට මේ දක්වා ක්‍රියා විරහිත වූ අවස්ථා සංඛ්‍යාව කොපමණද;

(ii) එම බලාගාරය නිරන්තරයෙන් ක්‍රියා විරහිත වීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය මේ දක්වා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

174/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කම්කරු දෙපාර්තමේන්තුව, ඇතැම් වෘත්තීය සමිති හා හාම්පුතුන්ගේ සංගමය එක්ව කම්කරුවකුගේ මාසික වැටුප රු.14,500/- දක්වා අඩු කිරීමට කොවිඩ් - 19 වසංගතය පැතිරීගිය පසුගිය කාලය තුළදී කටයුතු කර ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එම වැටුප් කප්පාදුව අත්හිටවනු ලබන දිනය කවරේද;

(ii) ලියාපදිංචිකර නොමැති අවිධිමත් අංශයේ රැකියාවල නියුක්ත වී සිටින කම්කරුවන්ගේ වැටුප් කප්පාදුව නැවැත්වීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද;

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

236/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂය තුළ—

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ පොල් තෙල් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම පොල් තෙල් ආනයනය කළ රටවල් කවරේද;

(iv) එම පොල් තෙල් ආනයනය කළ සමාගම්වල නම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට පොල් තෙල් ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

268/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ග්‍රාම නිලධාරි සේවය සඳහා සේවා ව්‍යවස්ථාවක් සකස් කළ යුතු බවත්;

(ii) ග්‍රාම නිලධාරින්ට ගෙවනු ලබන දීමනා පිළිබඳව නැවත සමාලෝචනය කර ඔවුන්ට සාධාරණයක් ඉටු කළ යුතු බවත්;

(iii) ග්‍රාම නිලධාරි සේවයේ හා ග්‍රාම නිලධාරි වෘත්තියේ පවතින ගැටලු පිළිබඳව අවධානය යොමු කළ යුතු බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ග්‍රාම නිලධාරි සේවයේ ඵලදායිතාවය ඉහළ නැංවීමට රජය පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

600/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය ඩෙල්ෆ් දූපතේ ඇති ප්‍රධාන ප්‍රවාහන මාර්ගය වන මාවිලිත්තුරෙයි සිට සාරාපිටි හරහා කෝට්ටයි කාඩු දක්වා වූ කිලෝමීටර 08ක දුර ප්‍රමාණයෙන් යුතු ඩෙල්ෆ් ප්‍රධාන මාර්ගය දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රතිසංස්කරණය කර නොමැති බවත්;

(ii) දැඩි අබලන් තත්ත්වයේ පවතින මෙම ප්‍රධාන මාර්ගය ශිෂ්‍යයන්, නිලධාරින්, වයෝවෘද්ධ තැනැත්තන් හා ගැබිනි මාතාවන්ද භාවිතා කරනු ලබන අතර ගිලන් රථද මෙම මාර්ගයේ ගමන් කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ප්‍රධාන මාර්ගය මේ වනතෙක් ප්‍රතිසංස්කරණය නොකිරීමට හේතු කවරේද;

(ii) මෙම මාර්ගය සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණය කරනු ලබන දින වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

633/2020

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකළපුව දිස්ත්‍රික්කයේ පිහිටා ඇති දික්කෝඩයි රෝහල ජනතා අවශ්‍යතා සඳහා භාවිතා කළ නොහැකි මට්ටමක පවතින බවත්;

(ii) මේ හේතුවෙන් එම රෝහලෙන් සේවා ලබා ගැනීම සඳහා පැමිණෙන රෝගීන් විවිධ දුෂ්කරතාවයන්ට මුහුණ දෙන බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) එම රෝහලෙන් දෛනිකව සේවා ලබා ගන්නා රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත රෝහලෙහි පවතින අඩුපාඩු සම්පූර්ණ කිරිමට කඩිනම් පියවර ගන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

657/2020

ගරු චන්දිම වීරක්කොඩි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල, රිච්මන්ඩ් විද්‍යාලයට ඉතාම ආසන්නයේ අංක 03, 04 වෙනි පටුමග, රිච්මන්ඩ් කන්ද, ගාල්ල යන ලිපිනයේ පදිංචිව සිටින එම්.එම්. ලෙව්මික තත්විදු ගුණතිලක යන දරුවා ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ඇතුළත් කර නොගත් බවත්;

(ii) 2019.11.10 වැනි දින යොමු අංක B - 378 යටතේ ඉදිරිපත් කරන ලද අභියාචනය සම්බන්ධව ස්ථානීය පරීක්ෂාවක් සිදු නොකොට එකී අභියාචනය නොසලකා මෙම දරුවා එම පාසලට ඇතුළත් කර නොගත් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මේ වනවිට මෙම දරුවාට අධ්‍යාපනය හැදෑරීම සඳහා පාසලක් නොමැති බැවින් මේ සම්බන්ධව අවශ්‍ය ඉදිරි පියවර ගනු ලබන දිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

668/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉදිකිරීමට යෝජිත මල්වතු ඔය වාරි ව්‍යාපෘතිය සඳහා වැය වන මුදල සපයා ගැනීමට අපේක්ෂිත ක්‍රමවේදය කවරේද;

(ii) එම ව්‍යාපෘතියේ ඉදිකිරීම් අවසන් කිරීම සඳහා ගතවන කාලය කොපමණද;

(iii) මෙම ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහි ද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

718/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ක්‍රීඩාංගණ සංවර්ධනය කිරීම, ක්‍රීඩා කටයුතුවලට පහසුවක් වන බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මලල ක්‍රීඩාව සඳහා ශ්‍රී ලංකාව තුළ මේ වනවිට පවතින ජාත්‍යන්තර ක්‍රීඩාංගණ සංඛ්‍යාව කොපමණද;

(ii) දිස්ත්‍රික් මට්ටමින් අංග සම්පූර්ණ ක්‍රීඩාංගණ ස්ථාපනය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කර තිබේද;

(iii) එසේ නම්, ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

721/2020

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මන්නාරම දිස්ත්‍රික්කයේ, නානාට්ටාන් ප්‍රදේශයේදී නව නිවසක් ඉදිකිරීම සඳහා 2020.02.18 දින අත්තිවාරමක් කැපීමේදී පෞරාණික වටිනාකමින් යුත් කාසි හමුවී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එහිදී හමුවී ඇති කාසි සංඛ්‍යාව කොපමණද;

(ii) එම කාසි අයත්වන යුගය කවරේද;

(iii) එම කාසි පරිහරණය කරන ලද කාලයේදී පැවති පාලනය කවරේද;

(iv) එම කාසිවල සටහන්ව ඇති මත්ස්‍ය හා කඩුව සංකේතයන් සහ එම කාසි පරිහරණය කරන ලද සමයේදී පැවති පාලනය අතර පැවති සම්බන්ධය කවරේද;

(v) එම කාසිවල පවතින පෞරාණික වටිනාකම පිළිබඳ කරුණු ඉතිහාසය විෂය නිර්දේශයට ඇතුළත් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

863/2020

ගරු මනූෂ නානායක්කාර මහතා,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020.01.01 සිට 2020.10.10 දක්වා ශ්‍රී ලංකාවට පැමිණි විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ශ්‍රමිකයන් පැමිණි රටවල්වල නම් කවරේද;

(iii) ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා මේ වනවිට ලියාපදිංචි වී සිටින විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම ශ්‍රමිකයන් සේවය කරනු ලබන රටවල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(ii) එම ශ්‍රමිකයන් නිරෝධායන කිරීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(iii) එම ශ්‍රමිකයන් නිරෝධායනය කිරීම සම්බන්ධීකරණය කිරීම සඳහා ඇවන්ට්ගාඩ් (Avant Garde) ආයතනයට ලබා දී තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා අනුගමනය කර ඇති ක්‍රමවේදය කවරේද;

(v) එක් ශ්‍රමිකයකු නිරෝධායනය කිරීම සඳහා ඇවන්ට්ගාඩ් ආයතනය විසින් අය කරනු ලබන මුදල කවරේද;

(vi) ඇවන්ට්ගාඩ් ආයතනය විසින් මේ වනවිට නිරෝධායනයට යොමු කර ඇති ශ්‍රමිකයන් සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

878/2020

ගරු එරාන් වික්‍රමරත්න මහතා,— රාජ්‍ය සේවා ,පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගේ ඇසීමට,— (1)

(අ) (i) දහනවවන ශත වර්ෂයේ මුල් භාගයේ දී ශ්‍රී ලංකා රජයෙහි සිවිල් අංශය සහ හමුදා අංශය ලෙස බෙදා දැක්වීමක් සිදු කරන ලද අවස්ථාවේ සිට ශ්‍රී ලංකාවේ රජය තුළ සිවිල් අංශයෙහි සාමාජිකයන් හමුදාමය අංශයටත් හමුදා අංශයෙහි සාමාජිකයන් සිවිල් අංශයටත් විධිමත් ලෙස පත් කරනු ලැබීමක් සිදුකොට තිබේ ද;

(ii) 2019.11. 17 දින සිට සන්නද්ධ හමුදාවල සේවය කරන කිසියම් සාමාජිකයන් සිවිල් තනතුරුවලට පත් කරනු ලැබ තිබේ ද;

(iii) එසේනම්, එම එක් එක් තැනැත්තාගේ නම් කවරේද;

(iv) ඔවුන් සිවිල් තනතුරුවලට පත් කිරීම සාධාරණීකරණය කරනු ලබන හේතුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) සන්නද්ධ හමුදාවල සේවය කරන සාමාජිකයන් සිවිල් තනතුරුවලට පත් කිරීමේ මෙම ප්‍රතිපත්තිමය වෙනස අමාත්‍ය මණ්ඩලය තුළ සාකච්ඡා කරනු ලැබුවේ ද;

(v) ශ්‍රී ලංකා පරිපාලන සේවය , ශ්‍රී ලංකා සැලසුම් සේවය, රජයේ වෛද්‍ය සේවය, ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය ආදිය තුළ අඩංගු සිවිල් සේවා තනතුරුවල රාජකාරි ඉටු කිරීම සඳහා හැකියාවන් ඇති නිලධාරීන් නොමැත්තේ ද;

(vi) එසේනම්, ඉහත කී සේවාවන් අඛණ්ඩව පැවතීමේ කිසියම් ප්‍රයෝජනයක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහි ද ?

(ආ) නොඑසේ නම් ඒ මන්ද?

940/2020

ගරු මුජිබුර් රහුමාන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සියලුම ග්‍රාම නිලධාරි වසම් ආවරණය වන පරිදි අඩු ආදායම්ලාභී පවුල්වලට නිවාස ඉදිකර දීමේ වැඩසටහනක් අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබන ග්‍රාම නිලධාරි වසම්වල නම් කවරේද;

(iii) කුලී නිවාසවල පදිංචිව සිටින පවුල් සඳහාද ඉහත වැඩසටහන ක්‍රියාත්මක කරන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

944/2020

ගරු මයන්ත දිසානායක මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 සිට 2019 දක්වා මහනුවර, පල්ලෙකැලේ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණයේ පවත්වා ඇති ජාත්‍යන්තර ක්‍රිකට් තරඟ සංඛ්‍යාව කොපමණද;

(ii) එම තරඟවලින් උපයාගෙන ඇති ආදායම එක් එක් තරගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වර්ෂ 2010 සිට 2019 දක්වා ඉහත ක්‍රීඩාංගණය නඩත්තු කිරීම සඳහා වෙන් කළ මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ක්‍රීඩාංගණයේ නඩත්තු කටයුතු ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය මඟින් සිදු කරනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

**2021 පෙබරවාරි 25 බ්‍රහස්පතින්දා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

43/2020

ගරු හේෂා විතානගේ මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා පොලිස් සේවයේ උප පොලිස් පරීක්ෂක තනතුරේ දැනට සිටින නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) බඳවා ගැනීම් පටිපාටියට අනුව උප පොලිස් පරීක්ෂක තනතුරේ සිටින නිලධාරියකුට, පොලිස් පරීක්ෂක තනතුර දක්වා උසස්වීම සඳහා සම්පූර්ණ කළ යුතු සේවා කාලය කොපමණද;

(iii) ඒ අනුව, නියමිත සේවා කාල සීමාව සම්පූර්ණ කළ උප පොලිස් පරීක්ෂක වරුන්ට උසස්වීම් ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

143/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— විදුලිබල අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලය විසින් ණය ලබා ගෙන ඇති රාජ්‍ය ආයතනවල සහ බැංකුවල නම් කවරේද;

(ii) 2015 වර්ෂයේ සිට මේ දක්වා ලංකා විදුලිබල මණ්ඩලය විසින් එකී ආයතනවලට හා බැංකුවලට ගෙවීමට ඇති ණය ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ලංකා විදුලිබල මණ්ඩලය මූල්‍යමය වශයෙන් ශක්තිමත් කිරීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

322/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව දියුණු කිරීම වෙනුවෙන් 2019 වර්ෂය සඳහා වෙන් කළ මුදල කොපමණද;

(ii) එම මුදලෙන් රජයේ පාසල් සඳහා වෙන් කළ මුදල කොපමණද;

(iii) ඉහත (i) හි සඳහන් මුදලෙන් පාසල් හැර ගිය දරුවන්ගේ ක්‍රිකට් ක්‍රීඩා කිරීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා වෙන් කළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ක්‍රිකට් ක්‍රීඩාවෙන් ජාත්‍යන්තර ජයග්‍රහණ ලබා ගැනීම වෙනුවෙන් පාසල් ක්‍රීඩකයන් මෙහෙයවීම සඳහා වන සැලසුම් සකස් කිරීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය හා ඊට අනුබද්ධ අනෙකුත් සංගම්වල පරිපාලන හා සංවර්ධන කටයුතු සඳහා රජය සම්බන්ධ වන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා සම්බන්ධ වන ආකාරය කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

488/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පිහිටා ඇති ක්‍රීඩා පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ක්‍රීඩා පාසල්වල නම් කවරේද;

(iii) එම එක් එක් ක්‍රීඩා පාසලේ මේ වනවිට ඉගෙනුම ලබන ශිෂ්‍යයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඔවුන්ට ලබා දෙනු ලබන දීමනා හා වෙනත් පහසුකම් කවරේද;

(v) ක්‍රීඩා පාසල් සංවර්ධනය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

533/2020

ගරු රෝහණ බංඩාර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටි රජයට අයත් වන ඔසුසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඔසුසල් පිහිටි ඇති ස්ථානවල ලිපිනයන් කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) රජයේ ඔසුසල් ශාඛා ජාලය, අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ තවදුරටත් ව්‍යාප්ත කිරීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

584/2020

ගරු වේලු කුමාර් මහතා,— වැවිලි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වැවිලි ක්ෂේත්‍රය ආශ්‍රිතව වතු වෛද්‍ය මධ්‍යස්ථාන (Estate Dispensary) ක්‍රියාත්මක වන බවත්;

(ii) එවැනි මධ්‍යස්ථානයක භාරකරු ලෙස වතු වෛද්‍ය සහායක (Estate Medical Assistant) තනතුර දරන්නෙකු කටයුතු කරන බවත්,

(iii) රෝගීන් පරීක්ෂා කර ඖෂධ නියම කිරීම, එම වතු වෛද්‍ය සහායකවරයා විසින් සිදු කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වැවිලි ක්ෂේත්‍රය ආශ්‍රිතව මේ වනවිට ක්‍රියාත්මක වන වතු වෛද්‍ය මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම මධ්‍යස්ථානයන්හි සේවය කරනු ලබන වතු වෛද්‍ය සහායකවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම වතු වෛද්‍ය සහායකවරුන්ගේ සුදුසුකම් කවරේද;

(iv) ඔවුන්ගේ කාර්යභාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම වතු වෛද්‍ය සහායකවරුන් විසින් ඉටු කරනු ලබන කාර්යභාරය නීත්‍යානුකූල වන්නේද;

(ii) නොඑසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

669/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යෝජිත කුඹුක්කන් ඔය වාරි ව්‍යාපෘතිය ආරම්භ කිරීමට අපේක්ෂා කරනු ලබන දිනය කවරේද;

(ii) එහි ඇස්තමේන්තුගත පිරිවැය කොපමණද;

(iii) එම වාරි ව්‍යාපෘතිය වෙනුවෙන් වැය වන මුදල් සපයා ගනු ලබන ක්‍රමවේදය කවරේද;

(iv) එම වාරි ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා ගතවන කාලය කොපමණද;

(v) එම ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

786/2020

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශිෂ්‍ය උපදේශන ගුරුවරුන් බඳවා ගැනීම පිණිස පැවති තරඟ විභාගයට පෙනී සිටි මුළු අයදුම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම විභාගය සමත් වූ සංඛ්‍යාව කොපමණද;

(iii) එම විභාගය සමත් වූවන්ට මේ වනතෙක් පත්වීම් ලබා දී නොමැති බව එතුමා දන්නේද;

(iv) එසේ නම්, ඉහත විභාගය සමත්වූවන්ට කඩිනමින් පත්වීම් ලබාදීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

860/2020

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සුරාබදු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්ය භාරය කවරේද;

(ii) ශ්‍රී ලංකාව තුළ පිහිටා ඇති මුළු සුරාබදු ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iii) එම සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සුරාබදු දෙපාර්තමේන්තුවේ සිටින මුළු නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) සුරාබදු දෙපාර්තමේන්තුවේ රජකාරි කටයුතු සඳහා එම නිලධාරින් සංඛ්‍යාව ප්‍රමාණවත් වන්නේද;

(iv) සුරාබදු දෙපාර්තමේන්තුව සඳහා නව නිලධාරින් බඳවා ගැනීමට කටයුතුකර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

867/2020

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 1970 කාලය වන තෙක් ක්‍රියාත්මකව පැවති ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පිහිටි කින්නියා සංචාරක අධිකරණය, උතුරු නැගෙනහිර පළාත්වල පැවති යුද්මය වාතාවරණය හේතුවෙන් තාවකාලිකව වසා දැමූ බවත්;

(ii) ස්ථිර ගොඩනැගිලි ඉදිකරන තෙක් එම අධිකරණ කටයුතු රජයේ ගොඩනැගිල්ලක තාවකාලිකව නැවත ආරම්භ කිරීමට පසුගිය වර්ෂයේදී පියවර ගනු ලැබුවද මේ වන තෙක් එම අධිකරණයේ කටයුතු ආරම්භ කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ත්‍රිකුණාමලය අධිකරණයේ ගොනු වන නඩු සංඛ්‍යාව අවම කිරීම සඳහා සහ කින්නියා ප්‍රදේශයේ ජනතාව නඩු කටයුතු වෙනුවෙන් ත්‍රිකුණාමලය වෙත යාමේදී ඇති වන දුෂ්කරතාවයන් අවම කිරීම සඳහා කින්නියා සංචාරක අධිකරණය නැවත ආරම්භ කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

873/2020

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තය ඉදිකිරීමෙන් ශ්‍රී ලංකාවට ලැබෙන ප්‍රතිලාභ කවරේද;

(ii) එය ඉදිකිරීම සඳහා වැය වන මුදල කොපමණද;

(iii) එම මුදල ශ්‍රී ලංකා වරාය අධිකාරියට දැරිය හැකි වන්නේද;

(iv) එම පර්යන්තය ඉදිකිරීමට ගත වන කාලය කොපමණද;

(v) එය ඉදිකිරීමෙන් ශ්‍රී ලංකාවට ලැබෙන වාර්ෂික ආදායම දළ වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

941/2020

ගරු මුජිබුර් රහුමාන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ දිස්ත්‍රික්කයේ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) සඳහා තාක්ෂණ විෂය ධාරාවෙන් පන්ති පැවැත්වෙන පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල තාක්ෂණ විෂය ධාරාව ඉගැන්වීම සඳහා අවශ්‍යවන ගුරුවරුන් සංඛ්‍යාව, මේ වනවිට සිටින ගුරුවරුන් සංඛ්‍යාව සහ මේ වනවිට පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් පාසල අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) සඳහා තාක්ෂණ විෂය ධාරාව ඉගැන්වීම සඳහා ගුරුවරුන් හිඟ වීමට බලපාන ලද හේතු කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

946/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) යාපනය දිස්ත්‍රික්කයේ වේලනයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇති වේලනයිතුරෙයි සිට පුංගුඩුතිව්, මඩත්තුවෙළි දක්වා වන පාලම ශ්‍රී ලංකාවේ පිහිටා ඇති දිගම පාලම්වලින් එකක් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාලමේ දිග කොපමණද;

(ii) එම පාලම අවසන් වරට ප්‍රතිසංස්කරණය කරන ලද වර්ෂය කවරේද;

(iii) එම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා වැය වූ මුදල කොපමණද;

(iv) ඒ සඳහා අරමුදල් සපයා ගන්නා ලද ප්‍රභවය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත පාලම මතින් ගමන් කිරීම දැඩි අවදානම් සහගත බවත්;

(ii) සාමාන්‍ය ජනතාව සහ වාහන විශාල ප්‍රමාණයක් ගමන් කරන මෙම පාලම මතදී බොහෝ අනතුරු සිදුවන බවත්;

එතුමා දන්නෙහිද?

(ඈ) (i) එම අනතුරු සිදු වීමට බලපාන හේතු කවරේද;

(ii) එම පාලම සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණය කරනු ලබන දින වකවානු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1018/2020

ගරු සංජීව එදිරිමාන්න මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා එවකට පැවති මහා නගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය භාරව කටයුතු කළ අමාත්‍යවරයා/අමාත්‍යවරුන්ගේ නම් කවරේද;

(ii) එම අමාත්‍යාංශය යටතේ පැවති ආයතනවල නම් කවරේද;

(iii) ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව, ඉහත අමාත්‍යාංශය යටතේ පැවතියේද;

(iv) වර්ෂ 2015 සිට 2019 දක්වා එම ආයතනය භාරව කටයුතු කරන ලද සභාපතිවරයා/සභාපතිවරුන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ආයතනයට යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර තිබේද;

(ii) ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකොට රු.මි. 670ක් වටිනා යන්ත්‍ර සූත්‍ර මිලදී ගෙන තිබේද;

(iii) එම මිලදී ගැනීමේදී යම් අක්‍රමිකතාවයක් සිදු වී තිබේ නම්, එම අක්‍රමිකතාවය කවරේද;

(iv) ඒ සඳහා වගකිව යුතු පුද්ගලයන්ගේ නම් කවරේද;

(v) ඒ සම්බන්ධයෙන් විධිමත් විමර්ශනයක් සිදු කර වරදකරුවන්ට එරෙහිව පියවර ගැනීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1019/2020

ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මහතා,— සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ ශ්‍රී ලංකාවට සම්පතක් වූ බවත්;

(ii) පසුගිය රජය සමයේදී එහි වී ගබඩා කරන ලද බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ගුවන්තොටුපළ තුළ වී ගබඩා කිරීමට හැකියාවක් තිබේද;

(ii) එම ගුවන් තොටුපළේ වී ගබඩා කරන ලද ස්ථානය කවරේද;

(iii) ගබඩා කරන ලද වී ප්‍රමාණය කොපමණද;

(iv) ඒ සඳහා උපදෙස් දෙන ලද පුද්ගලයන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වී ගබඩා කර තැබීමෙන් පසු එම පරිශ්‍රය යළි ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(ii) ඒ සඳහා වගකිව යතු පුද්ගලයන්ගෙන් එම මුදල අයකර ගැනීමට කටයුතු කර තිබේද;

(iii) නොඑසේ නම්, ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) ජාත්‍යන්තර ගුවන් තොටුපළක් තුළ වී ගබඩා කිරීමෙන් ශ්‍රී ලංකාව අන්තර්ජාතික වශයෙන් අපකීර්තියට පත්වූයේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?